**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) ජල නල කාර්මික II ශ්‍රේණිය**

**සුදුසුකම් :**

(අ) කියවීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතුය.

(ආ) පහත සඳහන් කරුණු පිළිබඳව නිපුණත්වයක් ලබා තිබිය යුතුය.

(I) අඟලෙන් 1/64 දක්වා වූ පරිමාණයන් කියවීමට හැකිවීම සහ ආයුධ නඩත්තු කිරීම හා ඒවායේ වත්මන් භාවිතය.

(II) නොයෙකුත් පිරිද්දුම් ඇතුලත්ව චීනවට්ටි (සී.අයි.) , ගැල්වනයිස් පයිප්ප (ජී.අයි.) සහ වාෂ්පීකරණ පයිප්ප (ලෙඩ්) ඇතිරීමට හා ඒවායේ විවිධ පිරිවැද්දුම් හා ඒවා පරීක්ෂා කිරීම.

(III) බෝලවැල්ව් , ජලනල පද්ධති ආදිය සවි කිරීම, ජල භාජන (CISTENS) ආදිය අළුත්වැඩියා කිරීම සහ සරල ඇඳීම් සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාව ආදිය පිළිබඳ ව දැනීම තිබිය යුතුය.

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක ජලනල කර්මාන්තය පිළිබඳ වසර දෙකකට නොඅඩු පළපුරුද්ද.

**අටවැන්න සමත් අපේක්ෂකයන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.**

වයස **:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම වයස් සීමාව රජයේ දෙපාර්තුමේන්තු, සංස්ථා හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය සඳහා අදාළ නොවේ.

**ඒකාබද්ධ මාසික වැටුප් ක්‍රමය :** රු.24209 -16 **x** 218 -27697 මාසිකව (2018 වසර සඳහා)
**[UPL 3 (III)]**
රු.29915 -16 **x** 270- 34235 මාසිකව (2020 වසර සඳහා)
**[UPL 3(III)]**

__අනෙකුත් වරප්‍රසාද__

| | |
|---|---|
| **විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමය** | : විශ්වවිද්‍යාලය මගින් ගෙවනු ලබන මාසික වැටුපෙන් 8% කට සමාන ප්‍රතිශතයක් බැර කරනු ලැබේ. |
| **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල** | : විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබන මාසික වැටුපෙන් 7%කට සමාන ප්‍රතිශතයක් බැර කරන අතර,සේවාදායකයාගේ වැටුපෙන් 10%කට සමාන ප්‍රතිශතයක් බැර කරනු ඇත. |
| **සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල** | : වැටුපෙන් 3%කට සමාන ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ඇත. |
| **අනෙකුත් දීමනා** | : රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. |

**බඳවා ගැනීමේ ක්‍රමය :** වෘත්තීය සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

අයදුම්පත් **“ නියෝජ්‍ය ලේඛකාධිකාරී / වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, නො 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07”** යන ලිපිනයට 2018.10.01 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් සහ අදාල විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පාලන අංශය වෙතින් පෞද්ගලිකව හෝ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් පිටුව (http:// pgim.cmb.ac.lk) මගින් ලබා ගත හැක.

අදාල සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වැඩිම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට හා වෘත්තීය පරීක්ෂණයට කැඳවීමේ අයිතිය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතුය.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා  හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

2018.09.03